# අපේ ගෙදරට ආ කුරුළු පැංචෝ



පළමු දිග හැරීම

IS38247

**තවිතිසා දිව්‍යාංජලී**
මහනුවර මහමායා බාලිකා විද්‍යාලය
2-D
2025-02-22

# ලෙන්ගතුව සිහි කරමි

නිතරම පුංචි මා හට ගුණදම් කියාදෙන
අති පූජ්‍ය ගන්තුනේ අස්සජි මහනායක හිමියන්ටත්
පූජ්‍ය අරන්දර විජිතනන්ද හිමියන්ටත්
මට ලිවීම කියා දුන්
පළමු හා දෙවන ශ්‍රේණිවල
සිසිර චන්ද්‍රලතා ගුරු මෑණියන්ටත්
ගයාත්‍රි සෙනවිරත්න ගුරු මෑණියන්ටත්
නිතරම පුංචි මම නිරෝගීව තැබීමට වෙහෙසෙන
තොරණගහපිටිය ග්‍රාමීය රෝහලේ
වෛද්‍ය රසික බාලසුරිය මාමාටත්
මාගේ ඉගෙනුමට සහාය වන දිරිය දෙන
මාගේ රත්තරං අම්මා, අප්පච්චි ඇතුළු සැම

සැමදා මා සමඟ
සෙල්ලම් කරමින් පාඩම් කරමින් මා ළඟින් සිටි
මාගේ ආදරණීය ලොකු අයියාටත්
සසුන්ගත වී සිටින මාගේ චූටි අයියා චූටි
හාමුදුරුවන්ටත්
මාගේ අක්කාටත්

# පුදම් බැතියෙන්

මා උපන් දා සිට

මට කවා පොවා

නලවා, ඔවාදී

සෙනෙහසින් මා රකින

මාගේ රත්තරන් අත්තම්මාටත්

මා බහ තෝරන වියේ සිට

මා නින්දට යාමට පෙර

අලුත් කතන්දරයක් කියා දෙන

ලොකු අත්තම්මාට



# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ජෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුලින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.


ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **“හෙරණගත්කරණී”** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.



දිනක් මා උදේම අවදි වුණා. හොඳින් දත් මැද මුව සෝදා ගත්තා. මා සාලයේ සිටියදී මාගේ රත්තරන් අම්මා තේ කෝප්පයක් ගෙනවිත් දුන්නා. මා එය රසවිඳිමින් හිරු නැග එන අහස දෙස බලා සිටියා. චූටි වේලාවක් ගතවෙද්දි කීචි බීචි ගී රාවයක් පුංචි මගේ දෙසවනට ඇසුණා. හනි හනිකට මා වට පිට බැලුවා.



පුංචි මා දුටුවේ කුඩා කුරුළු

පැටව් ගොඩකි. මට ඇති වූ

සතුට කියා නිම කළ නොහැක.

මා අම්මේ ! අම්මේ ! කියමින්

මගේ අම්මාට අඬ ගැසුවා.

අම්මා හනි හනික මා සිටින

තැනට ආවා. මම අම්මාට

කුරුළු පැටව් ටික පෙන්නුවා.


අම්මේ අපි එයාලට මොනවාද

දෙන්නේ ? මම අම්මාගෙන්


ඇසුවා.




අම්මා ගේ ඇතුළට ගියා. චූටි වේලාවකින් කුරුල්ලන්ට දමන්නට හාල් ටිකක් ගෙනවිත් පුංචි මගේ අතට දුන්නා. මා එය කුරුළු පැටව් සහ කුරුළු අම්මා ඉන්න තැනට දැම්මා. කුරුළු අම්මා සහ චූටි පැටව් හාල් ඇහිද ඇහිද හරි සතුටින් කෑවා. චූටි බංඩි ගෙඩි පුරවාගත් එයාලා හරි සතුටින් චූටි නැටුමක් නැටුවා.



මම පුංචි අත්පුඩි ගසමින් උඩ පැන පැන එයාලාගේ නැටුම් දෙස බලා සිටියේ ගොඩක් සතුටින්. කුරුළු ලෝකය කෙතරම් සුන්දරද මට හිතුණා. අම්මාත් කුරුළු පැටවුන්ගේ නැටුම දෙස ඉතා සතුටින් ඇසිපිය නොහෙළා බලා සිටින ආකාරය මම දුටුවා.



ආයෙත් කීච් බීච් කීච් බීච් හඩ නගමින් පුංචි මට බොහොම ස්තූතියි ! කියන්නාක් මෙන් පුංචි අත්තටු සලමින් නිල්වන් ගුවන් තලය දෙසට එයාලා පියඹා ගියා.



නිමි




# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගිම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසිම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනිම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලූ ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වගයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දි තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්



IS38247